# 6 ශ්‍රේණිය සිංහල -2022

## 05 ඒකකය

## නාම පද හා එහි ප්‍රභේද





සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


06 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 02ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.


Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 05. නාම පද හා එහි ප්‍රභේද

මනුෂ්‍යයා භාෂාව යොදා ගන්නේ තවත් කෙනකු සමඟ අදහස් හුවමාරු කර ගැනීමට හා තමන්ගේ හැඟීම් කියා පෑමට යි. අදහසක් හෝ හැඟීමක් කියා පෑමට මනුෂ්‍යයාගේ මුවෙන් පිටවන අර්ථයක් සහිත ශබ්ද, පද යනුවෙන් හැඳින්වෙයි. මේ පද ලේඛනයේ දී අකුරු මඟින් ලියා දැක්වෙයි.

පද වර්ග කිහිපයකි. නාම පද ඒ අතරින් එකකි. පුද්ගලයකු, තැනක්, දෙයක්, ගුණයක් හෝ තත්ත්වයක් නැත හොත් අදහසක් පිළිබඳ අර්ථයක් දෙන්නේ නාම පද යි.

1. <u>භයංකර සත්ත්වයා</u>
   ලියනාඩෝ ඩාවින්චිගේ උපමා කතා
   පරිවර්තනය :- තනූජා ධර්මපාල

- මෙම උපමා කතාවෙහි සඳහන් වන යම් කෙනෙකු, සතකු, දෙයක්, ස්ථානයක් හෝ ස්වභාවයක් හැඳින්වීමට භාවිත කරන පද, නාම පද ලෙස හැඳින්වෙයි.

  - ✓ යම් කෙනෙකු - ඔවුහු
  - ✓ යම් සතකු - සත්තු, වනසතා
  - ✓ යම් තැනක්/ ස්ථානයක් - වනය, නිජබිම
  - ✓ යම් දෙයක් - රුක, ගිනිබෝල
  - ✓ යම් ස්වභාවයක් - බිය, උද්දාමය

2. <u>දඬුවම් ලැබූ මහ ඇමතිහුගේ කථාවස්තුව</u>
   ආරාබි නිශොල්ලාසය

- යම් නාම පදයකින් එක් අයකු, එක් දෙයක්, එක් ස්ථානයක් හෝ එක් ස්වභාවයක් ගැන කියවේ නම් ඒවා ඒක වචන නාම පද යි. උදා:

  - ✓ කපන්නා
  - ✓ කුරුල්ලා
  - ✓ මම
  - ✓ පැල්පත
  - ✓ රුක
  - ✓ ගුරුතුමා
  - ✓ රට
  - ✓ උදැල්ල



➢ නාම පදයකින් බොහෝ අය, බොහෝ දේවල්, බොහෝ ස්ථාන ගැන කියවේ නම් ඒවා **බහු වචන නාම** පද යි. උදා:

- ✓ කපන්නෝ
- ✓ කුරුල්ලෝ
- ✓ අපි
- ✓ පැල්පත්
- ✓ රුක්
- ✓ ගුරුවරු
- ✓ රටවල්
- ✓ උදලු

## ලිඛිත අභ්‍යාස

1. කතාවේ ඇති පහත දැක්වෙන නාම පද ඒක වචන, බහු වචන වශයෙන් වගු ගත කරන්න.
සත්තු, ඔවුහු, වනය, රුක, රාවය, පණිවිඩය, වන සතා, නරියා, කපටියා, ජීවිත, ඒකා, පක්ෂීහු, උෟ, සත්ත්වයෝ, බෝල, ඇස්, කුරුල්ලෝ, නිජ බිම.

| ඒක වචන | බහු වචන |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

2. ඒක වචන නාම පද දහයක් හා බහු වචන නාම පද දහයක් සොයා ලියන්න.
3. පහත දැක්වෙන නාම පද ඒක වචන නම් බහු වචන බවට ද බහු වචන නම් ඒක වචන බවට ද හරවා ලියන්න.
(ගොවියා, කම්කරුවෝ, නීතිඥයා, මිනින්දෝරුවෝ, වඳුරා, බල්ලෝ, බළලා, ඉබ්බෝ, ලේනා, නිවාසය, ගස්, සඟරාව, පුටුව, රූපවාහිනිය, පාසල, භෝජනාගාරය, විශ්වවිද්‍යාලය, පන්ති කාමරය, ආයතනය)

| ඒක වචන | බහු වචන |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

- **ලිඛිත අභ්‍යාස**

1.

| **ඒක වචන** | **බහු වචන** |
|---|---|
| වනය | සත්තු |
| රුක | ඔවුහු |
| රාවය | ජීවිත |
| පණිවිඩය | පක්ෂීහු |
| වන සතා | සත්ත්වයෝ |
| නරියා | බෝල |
| කපටියා | ඇස් |
| ඒකා | කුරුල්ලෝ |
| උඹ | - |
| නිජ බිම | - |

2. **ඒක වචන**

- ✓ පුත්‍රයෙක්
- ✓ අසු
- ✓ කුමරු
- ✓ භාර්යාව
- ✓ දුවෙක්
- ✓ නුඹ
- ✓ සුල්තන් රජ
- ✓ ශාහ්‍රියර් රජ
- ✓ කාන්තාව
- ✓ මුවෙකු



**බහු වචන**

- ✓ අප
- ✓ සත්තු
- ✓ ඔවුහු
- ✓ ගිනිබෝල
- ✓ වැද්දෝ
- ✓ කුඩමස්සු
- ✓ දිය කඩිති
- ✓ මකුළුගෙඩි
- ✓ අතුරිකිලි
- ✓ ඊතල

**3.**

| ඒක වචන | බහු වචන |
|---|---|
| ගොවියා | ගොවියෝ |
| නීතිඥයා | නීතිඥයෝ |
| වඳුරා | වඳුරෝ |
| බළලා | බළල්ලු |
| ලේනා | ලේන්නු |
| නිවාසය | නිවාස |
| සඟරාව | සඟරා |
| පුටුව | පුටු |
| රූපවාහිනිය | රූපවාහිනී |
| පාසල | පාසල් |
| භෝජනාගාරය | භෝජනාගාර |
| විශ්වවිද්‍යාලය | විශ්වවිද්‍යාල |
| පන්ති කාමරය | පන්ති කාමර |
| ආයතනය | ආයතන |
| කම්කරුවා | කම්කරුවෝ |
| මිනින්දෝරුවා | මිනින්දෝරුවෝ |
| බල්ලා | බල්ලෝ |
| ඉබ්බා | ඉබ්බෝ |
| ගස | ගස් |

### ප්‍රායෝගික අභ්‍යාස

1. මෙම උපමා කතාවේ ඇති නාම පද පිළිබඳව අවධානය යොමු කරමින් කියවන්න.
2. තවත් මෙවැනි කතාවක් සොයා එහි එන නාම පද ලකුණු කරන්න.

➢ සිංහල භාෂාවේ පුරුෂ තුනක් දක්නට ලැබේ.

1 උත්තම පුරුෂ
2 මධ්‍යම පුරුෂ
3 ප්‍රථම පුරුෂ

| පුරුෂය | ඒක වචන | බහු වචන |
| --- | --- | --- |
| උත්තම පුරුෂ | මම සමත් වෙමි.<br>මම මල් කඩමි. | අපි සමත් වෙමු.<br>අපි මල් කඩමු. |
| මධ්‍යම පුරුෂ | නුඹ නරඹන්නෙහි.<br>ඔබ දුවන්නෙහි.<br>තෝ යන්නෙහි. | නුඹලා නරඹන්නෙහු.<br>ඔබලා දුවන්නෙහු.<br>තොපි යන්නෙහු. |
| ප්‍රථම පුරුෂ | ඔහු ඇසුරු කරයි.<br>ඇතා අලංකාර කරයි.<br>සොයුරිය ගායනා කළා ය.<br>ගස ආහාර ලබා දෙයි. | ඔවුහු ඇසුරු කරති.<br>ඇත්තු අලංකාර කරති.<br>සොයුරියෝ ගායනා කළහ.<br>ගස් ආහාර ලබා දෙයි. |

### ලිඛිත අභ්‍යාස

1. ඉහත දී ඇති කතා වස්තුවෙහි එන නාම පද සියල්ල ලකුණු කොට ඒවා උත්තම, මධ්‍යම, ප්‍රථම යන පුරුෂ තුනට වෙන් කර දක්වන්න.
2. පෙළ පොතෙහි ඔබ කැමති පාඩමක් තෝරා ගෙන එහි නාම පද පුරුෂ තුනට වෙන් කොට දක්වන්න.

- **ලිඛිත අභ්‍යාස**

1.

| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
| --- | --- | --- |
| මම<br>මම<br>අප<br>මම<br>මම<br>මට | තී<br>ඔබ<br>නුඹ<br>නුඹ<br>නුඹ | රජෙක්, පුත්‍රයෙක්, පුත්‍ර තෙමේ, රජ, ඕහට, පුතු, මහ ඇමතිහට, රජ කුමර තෙම, දඩයම්කරුවන්, මුවෙකු, කුමර තෙමේ, මහ ඇමති, මුවෙකු, පිරිසගෙන්, මහ ඇමතිහු, කාන්තාවක්, ඕහට, කුමර තෙමේ, ඇගෙන්, අසු, ඈ, ඕතොමෝ, රජකුගේ, දුවක්, අස්තෙමේ, උෟ, කුමර තෙමේ, ඈ, ඕතොමෝ, එදෙදෙන, කුමරු, කාන්තාව, අසු, ඕතොමෝ, හෙතෙමේ, අසු, කාන්තාව, කුමර තෙමේ, යෞවනයකු, දරුවෝ, ඔහු, රජ කුමර තෙමේ, රජ කෙනෙකු, දුවෙක්, කාන්තාව, රාක්ෂසයකු, මගීන්, භාර්යාවක, කුමර තෙමේ, අසු, රජ දුවෙක්, කාන්තාව, කුමරු, හෙතෙම, ඕතොමෝ, දෙවියන් වහන්සේ, උන්වහන්සේ, කුමර තෙමේ, ෂිහර්සාදි, රජ්ජුරුවන්, දිනර්සාදි තොමෝ, කුමරු, ඔහු, සුල්තන් රජ, බිසව, ශාඃරියර් රජ තෙමේ, කුමරු, ෂිහර්සාදිය |

2.

| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|
| මම<br>අපි<br>මා<br>අප | නුඹ<br>තෝ<br>නුඹලා<br>තොපි/තෙප<br>යුෂ්මතා | කුඩමස්සන්, කිරිකොක්කු, මානකොක්කු, මැටිකොක්කු, කණකොකකු, ඉබ්බා, නරියෙක්, නරි අයියා, |

3. රූකඩ කපන්නාගේ කම්මල
   අපේ ගම
   මාර්ටින් වික්‍රමසිංහ

- උක්ත පද- කර්තෘ කාරක වාක්‍යයක අවසාන ක්‍රියා පදයෙන් උක්ත වන කේවල නාම පද හා ද, හා, ත් යන සමුච්චයාර්ථ නිපාත යෙදී වාක්‍යයක කර්තෘ වශයෙන් යෙදෙන පදත්, ද්විත්ව කර්තෘ පද හා නාමාඛ්‍යාත පදත් කර්ම කාරක වාක්‍යයක කර්මය දැක්වෙන පදත් සැම විට ම උක්ත ස්වරූපයෙන් තබනු ලැබේ.
  - ✓ ගුරුවරු ශිෂ්‍යයන් අගය කරති.
  - ✓ අම්මා ද අක්කා ද කඩයට යති.
  - ✓ මාර්ටින් වික්‍රමසිංහ දක්ෂ ලේඛකයෙක් වෙයි.
  - ✓ ගොවියන් විසින් හරක් දැක්කෙති.
- අනුක්ත පද- කර්තෘ කාරක වාක්‍යයක කර්මය වශයෙන් යෙදෙන නාම පදත් මෙන්, සේ, වැනි, කරා, උදෙසා, සඳහා යන නිපාත ආශ්‍රිත නාම පදත් වූ කෘදන්තයට මුලින් යෙදෙන නාම පද හා අසම්භාව්‍ය ක්‍රියා ආශ්‍රිත නාම පදත් සෑම විට ම අනුක්ත ස්වරූපයෙන් තබනු ලැබේ.
  - ✓ ගුරුවරු ශිෂ්‍යයන් අගය කරති.
  - ✓ ඔහු ඇතෙකු මෙන් ශක්තිමත් පුරුෂයෙකි.
  - ✓ ගොවියන් විසින් හරක් දැක්කෙති.

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| මම | මා |
| අපි | අප |
| නුඹ | නුඹ |
| නුඹලා | නුඹලා |
| තෝ | තා |
| තොපි | තෙපි |

| | |
|---|---|
| ඔහු | ඔහු |
| ඕ/ඈ/ඇය | ඇය |
| ළමයා | ළමයා |
| ළමයි | ළමයි |
| ගෙවිලිය | ගෙවිලිය |
| ගෙවිලියක් | ගෙවිලියක |
| ගොවියෙක් | ගොවියෙකු |
| ගෙවිලියෝ | ගෙවිලියන් |
| ගොවියෝ | ගොවියන් |
| කුරුල්ලෝ | කුරුල්ලන් |

## ලිඛිත අභ්‍යාස

1. ඉහත කතාවෙන් උපුටා ගත් පහත සඳහන් නාම පද උක්ත-අනුක්ත වශයෙන් හඳුනා ගෙන අදාළ කොටුවේ '✓' ලකුණ යොදන්න. උක්ත-අනුක්ත දෙකෙහි ම යෙදිය හැකි නාම පද ඇත්නම් අදාළ කොටු දෙකෙහි ම '✓' ලකුණ යොදන්න.

| නාම පදය | උක්ත | අනුක්ත |
|---|---|---|
| කපන්නා | | |
| කුරුල්ලන් | | |
| හාවන් | | |
| මුගටියන් | | |
| කැබල්ලෑවන් | | |
| නාගරිකයෝ | | |
| ගම්වැසියෝ | | |
| පැල්පත | | |
| කටුගෙය | | |
| ඔහු | | |
| වැඩිහිටියන් | | |
| තරුණයන් | | |
| ගැමියෝ | | |
| කවීන් | | |
| කවීහු | | |

- ## ලිඛිත අභ්‍යාස

**1.**

| නාම පදය | උක්ත | අනුක්ත |
|---|---|---|
| කපන්නා | √ | √ |
| කුරුල්ලන් | | √ |
| හාවන් | | √ |
| මුගටියන් | | √ |
| කැබල්ලෑවන් | | √ |
| නාගරිකයෝ | √ | |
| ගම්වැසියෝ | √ | |
| පැල්පත | √ | √ |
| කටුගෙය | √ | √ |
| ඔහු | √ | √ |
| වැඩිහිටියන් | | √ |
| තරුණයන් | | √ |
| ගැමියෝ | √ | |
| කවීන් | | √ |
| කවීහු | √ | |

2. හිස්තැන්වලට ගැළපෙන උක්ත පද වරහන් තුළින් තෝරා ලියන්න.

i. (ළමයි/ළමයින්) .......................... බයිසිකල් පදිති.
ii. (මම/මා) .......................... ඔවුන් ඇමතුවෙමි.
iii. (කුරුල්ලෝ/කුරුල්ලන්) .......................... අහසේ පියාසර කරති.
iv. (ඔවුන්/ඔවුහු) .......................... නේවාසිකාගාරය තුළ රැඳී සිටිති.
v. (තොප/තොපි) .......................... පව් නො කරහු.
vi. (ගායිකාවක/ගායිකාවක්) .......................... සම්මාන ලැබුවා ය.
vii. (රජවරුන්/රජවරු) .......................... මහ වැව් තැනූහ.
viii. (සිංහයෝ/සිංහයන්) ..........................තණ කොළ නො කති.
ix. (භික්ෂූහු/භික්ෂූන්) .......................... සෙත් පිරිත් දේශනා කරති.
x. (චිත්‍ර ශිල්පීන්/චිත්‍ර ශිල්පීහු) .................... තම නිර්මාණ ප්‍රදර්ශනය කරති.

**2.**

I. ළමයි බයිසිකල් පදිති.
II. මම ඔවුන් ඇමතුවෙමි.
III. කුරුල්ලෝ අහසේ පියාසර කරති.
IV. ඔවුහු නේවාසිකාගාරය තුළ රැඳී සිටිති.
V. තොපි පව් නො කරහු.
VI. ගායිකාවක් සම්මාන ලැබුවා ය.
VII. රජවරු මහ වැව් තැනූහ.
VIII. සිංහයෝ තණ කොළ නො කති.
IX. භික්ෂූහු සෙත් පිරිත් දේශනා කරති.
X. චිත්‍ර ශිල්පීහු තම නිර්මාණ ප්‍රදර්ශනය කරති.

3. හිස්තැන්වලට ගැළපෙන අනුක්ත පද වරහන් තුළින් තෝරා ලියන්න.

i. මව (දරුවෝ/දරුවන්) ........................... පසසයි.
ii. මකුළුවෝ (කෘමීන්/කෘමීහු) ........................... ආහාරයට ගත්හ.
iii. විදුහල්පතිතුමිය (ශිෂ්‍යාවන්/ශිෂ්‍යාවෝ) ..................... ආරක්ෂා කළා ය.
iv. මම (තොප/තොපි) ........................... හඳුනමි.
v. හාවෝ (ඉබ්බෝ/ඉබ්බන්) ........................... සමග තරඟයට දුවති.
vi. ඔහුගේ ගායනය (අප/අපි) ........................... පිනවී ය.
vii. ගැරඬියා (මීයෝ/මීයන්) ........................... අල්ලයි.
viii. රසිකයෝ (නිර්මාණකරුවන්/නිර්මාණකරුවෝ) ....................... අගයති.
ix. රෝගීහු (හෙදියන්/හෙදියෝ) ........................... කැඳවා ගත්හ.
x. ගුරුතුමා (මම/මා) ........................... ඇමතුවේ ය.

**3.**

I. මව දරුවන් පසසයි.
II. මකුළුවෝ කෘමීන් ආහාරයට ගත්හ.
III. විදුහල්පතිතුමිය ශිෂ්‍යාවන් ආරක්ෂා කළා ය.
IV. මම තොප හඳුනමි.
V. හාවෝ ඉබ්බන් සමග තරඟයට දුවති.
VI. ඔහුගේ ගායනය අප පිනවී ය.
VII. ගැරඬියා මීයන් අල්ලයි.
VIII. රසිකයෝ නිර්මාණකරුවන් අගයති.
IX. රෝගීහු හෙදියන් කැඳවා ගත්හ.
X. ගුරුතුමා මා ඇමතුවේ ය.

4. ශුද්ධෝදය කතා
   රන් කෙඳි කුමාරිකාව
   තුන් බෑ යෝධයෝ
   මාර්ටින් වික්‍රමසිංහ

- **ප්‍රාණවාචී නාම පද** - මිනිසුන්, සතුන් හා කල්පිත ජීවීන් (දේව, යක්ෂ, ආදි) හඟවන නාම පද සචේතන, එනම් පණ ඇති හෙවත් ප්‍රාණවාචී පද ලෙස හඳුන්වයි. උදා:
  - ✓ <u>යකඩතිස්ස කුමරයා</u> ගින්දර ඉල්ලුවේ ය.
  - ✓ <u>රාස්සි</u> ළිපක් පෙන්නුවා ය.

- **අප්‍රාණවාචී නාම පද** - ගස් වැල් හා සෙසු අප්‍රාණික දෑ හඟවන නාම පද අප්‍රාණවාචී හෙවත් අචේතනික නාම පද ලෙස ලෙස හඳුන්වයි. උදා:
  - ✓ ළිපේ <u>ගින්දර</u> දැල්වෙයි.

- **පුරුෂ ලිංග නාම පද** - ප්‍රාණවාචී නාම පද අතරින් පුරුෂවාචී බවක් හඟවන නාම පද, පුරුෂ ලිංග නාම පද ලෙස හඳුන්වයි. උදා:
  - ✓ <u>යකඩතිස්ස කුමරයා</u> ගින්දර ඉල්ලුවේ ය.

- **ස්ත්‍රී ලිංග නාම පද** - ස්ත්‍රීවාචී බවක් හඟවන නාම පද ස්ත්‍රී ලිංග නාම පද ලෙස හඳුන්වයි. උදා:
  - ✓ <u>රාස්සි</u> ළිපක් පෙන්නුවා ය.

නාම පද

- ප්‍රාණවාචී හෙවත් සචේතන නාමපද
  - පුරුෂ ලිංග නාම පද
    1. ගිරවා
    2. බල්ලා
    3. වෛද්‍යවරයා
    4. ගොවියා
    5. වඳුරා
    6. කුරුල්ලා
  - ස්ත්‍රී ලිංග නාම පද
    1. ගිරවිය
    2. බැල්ලිය
    3. වෛද්‍යවරිය
    4. ගෙවිලිය
    5. වැඳිරිය
    6. කිරිල්ලිය
- අප්‍රාණවාචී හෙවත් අචේතන නාම පද
  - නපුංසක ලිංග නාමපද
    1. පුටුව
    2. රබාන
    3. වැව
    4. සීගිරිය
    5. පොත
    6. පුස්තකාලය



1. පහත දැක්වෙන නාම පද පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග වශයෙන් වගු ගත කරන්න.
(ගිරවා, පොත, පැන, නිවස, වඳුරා, ගැහැනිය, මහිලාව, බල්ලා, බැළලිය, ගස, ගඟ, කුරුල්ලා, යහළුවා, ලේඛිකාව, ගුරුතුමිය)

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග |
|---|---|---|
| | | |

2. තුන් බෑ යෝධයෝ කතාවේ ඇතුළත් නාම පද පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග වශයෙන් වර්ග කර දක්වන්න.

- **ලිඛිත අභ්‍යාස**

**1.**

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග |
|---|---|---|
| ගිරවා | ගැහැනිය | පොත |
| වඳුරා | මහිලාව | පැන |
| බල්ලා | බැළලිය | නිවස |
| කුරුල්ලා | ලේඛිකාව | ගස |
| යහළුවා | ගුරුතුමිය | ගඟ |

**2.**

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග |
|---|---|---|
| සහෝදරයෝ | රාස්සිය | කෙත් |
| සහෝදරයා | ඈ | වනාන්තරය |
| මුවන්තිස්ස | - | උදලු කොටය |
| සහෝදරයන් | - | කුඹුර |
| ඔහු | - | වීර |

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග |
|---|---|---|
| මුවන් | - | පලු, කොත් |
| මුවකු | - | කෝන්, වී ගොඩ |
| කුමාරයා | - | ගස්, කන්ද |
| මාමා | - | බිම, කඩුව |
| මලණුවන් | - | ගෙදර, ගඟ |
| ඔවුහු | - | වී, කිතුල් |
| අලියකු | - | බිත්තර, යකඩ බෝල |
| මාළු | - | හේන, ගිනි පෙනෙල්ල |
| යෝධයක් | - | වී බිස්ස, ළිප |
| මාළුවා | - | ගොයම්, හැළිය |
| දරුවකු | - | දාගැබ්, ළිප්ගල්, බිංගෙය |



**6 ශ්‍රේණිය** **සිංහල භාෂාව**

**5 වන පාඩම**

## නාම පද හා එහි ප්‍රභේද

(1) නාම පද යන්න හඳුන්වා උදාහරණ 3ක් දෙන්න.

.................................................................................................
.................................................................................................
.................................................................................................

(2) වචන භේදය අනුව නාම පද වර්ග කරන්න. උදාහරණ සපයන්න.

.................................................................................................
.................................................................................................
.................................................................................................

(3) ලිංග භේදය අනුව නාම පද වර්ග කරන්න. උදාහරණ සපයන්න.

.................................................................................................
.................................................................................................
.................................................................................................

(4) පහත සඳහන් වචනවල අනුක්ත පදය ලියන්න.

i මම

ii අප

iii කුරුල්ලෝ

iv ඔවුහු

v කවීහු

(5) සුදුසු අතීත කාල ආඛ්‍යාත පදය යොදන්න.

i මම සරුංගලය ____________________________.

ii අපි අධ්‍යාපන චාරිකාව ____________________________.

iii කුරුල්ලෝ අහසේ __________________________.

iv ඔවුහු චිත්‍ර _________________________.

v තොපි සෙල්ලම් _____________________.

# නාම පද හා එහි ප්‍රභේද

පාඩම හොඳින් කියවා පහත අභ්‍යාසවලට පිළිතුරු සපයන්න.

**01. හිස්තැනට සුදුසු වචනය කොටුව තුළින් තෝරා ලියන්න.**

______ මගින් අදහස් හුවමාරු කරගන්නා එකම සත්ත්වයා______ ය. යම් අදහසක් හෝ හැඟීමක් කියා පෑමට මනුෂ්‍යාගේ මුවෙන් පිටවන ______ පද නම් වේ.සිංහලයේ ______ වගර් කිහිපයකි. ______ ඒ අතරින් එක් පද වගර්යක් වේ.

| නාම පද | ශබ්ද | භාෂාවක් | පද | මනුෂ්‍යයා |
|---|---|---|---|---|

**02. පහත දැක්වෙන නාම පද අදාළ කොටුව තුළ යොදන්න.**

(ළමයා, නැව, සේවකයා, නිවස, පත්තරය, මුවෝ, මොනරා, කුඹුර, ගහ, නංගී)

| ප්‍රාණවාචී | අප්‍රාණවාචී |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

**03. පහත නාම පද ඒක වචන හා බහු වචන වශයෙන් හඳුනා ගෙන අදාළ කොටුවේ '✓ ' ලකුණ යොදන්න.**

| නාම පද | ඒක වචන | බහු වචන |
|---|---|---|
| හාවෝ | | |
| පැල්පත් | | |
| කටුගෙය | | |
| ගැමියෝ | | |
| නගරය | | |
| ගම්මානය | | |
| ගෙවල් | | |
| පැන | | |
| කුඹුරු | | |
| පිට්ටනිය | | |

අන්තගර්තය : ඩබ්.ජී.ඒ.සී.දිල්හානි මිය, වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව
සැකසුම : එස්.ඒ.ආර්.එල්.සමරතුංග, ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක.බලංගොඩ

**04. පහත කොටුව තුළ ඇති නාම පද පුරුෂ භේදය අනුව වගර් කරන්න.**

| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(මම. නුඹ,  .කුමරිය, අපි, ඔබ, ළමයා, යුෂ්මතා, ධීවරයෝ, තොපි, අම්මා)

5 පහත දැක්වෙන පුරුෂ ලිංග නාම පදවලට ගැළපෙන ස්ත්‍රී ලිංග පදය යා කරමු.

| **පුරුෂ ලිංග** | **ස්ත්‍රී ලිංග** |
|---|---|
| මොනරා | මිතුරිය |
| තාත්තා | ගුරුතුමිය |
| කුරුල්ලා | සෙබඩ |
| ගුරුතුමා | අම්මා |
| මිතුරා | කිරිල්ලී |

6 පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද  වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

I නාම පදයක් යනු පුද්ගලයෙක් හා ස්ථානයක් පිළිබඳ පමණක් කියවෙන පද වේ. ( )

II 'මම" යනු උත්තම පුරුෂ ඒක වචන නාම පදයකි. ( )

III 'කවීහු' යන උත්තම පුරුෂ බහු වචන නාම පදයේ අනුක්ත නාමය 'කවීන්' වේ. ( )

IV ගෙවිලිය යනු ස්ත්‍රී ලිංග ඒක වචන  නාම පදයකි. ( )

**අන්තගර්තය : ඩබ්.ජී.ඒ.සී.දිල්හානි මිය, වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව**
**සැකසුම : එස්.ඒ.ආර්.එල්.සමරතුංග, ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක.බලංගොඩ**

# පිළිතුරු



**Answer**

6 ශ්‍රේණිය

සිංහල භාෂාව

5 වන පාඩම

නාම පද හා එහි ප්‍රභේද

1. යම් කෙනෙකු, සතකු, දෙයක්, ස්ථානයක් හෝ ස්වභාවයක් හැඳින්වීමට භාවිත කරන පද, නාම පද ලෙස හඳුන්වයි. උදා: සත්තු, ඔවුහු, වනය, රැක, රාවය, පණිවිඩය, වන සතා, නරියා, කපටියා, ජීවිත, ඒකා, පක්ෂීහු. . . .

2.

- ✓ ඒක වචන - ගොවියා, නීතිඥයා, වඳුරා. . .
- ✓ බහු වචන - කම්කරුවෝ, මිනින්දෝරුවෝ, බල්ලෝ. . .

3.

- ✓ පුරුෂ ලිංග නාම පද - ගිරවා, වඳුරා, බල්ලා. . .
- ✓ ස්ත්‍රී ලිංග නාම පද - ගැහැනිය, මහිලාව, ලේඛිකාව. . .
- ✓ නපුංසක ලිංග නාමපද - පොත, පෑන, නිවස. . .

4.

I. මම - මා
II. අප - අපි
III. කුරුල්ලෝ - කුරුල්ලන්
IV. ඔවුහු - ඔවුන්
V. කවීහු - කවීන්

5.

I. මම සරුංගලය යැවුවෙමි.
II. අපි අධ්‍යාපන චාරිකාව ගියෙමු.
III. කුරුල්ලෝ අහසේ පියෑඹුවෝ ය./ පියෑඹූ හ.
IV. ඔවුහු චිත්‍ර ඇන්දෝ ය./ ඇන්ද හ.
V. තොපි සෙල්ලම් කළෙහු.

- ❖ සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- ❖ සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- ❖ භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය - විමල් ජී. බලගල්ලේ

**නාම පද හා එහි ප්‍රභේද**

**පිළිතුරු පත්‍රය**

**1.**

I. භාෂාවක්
II. මනුෂ්‍යයා
III. ශබ්ද
IV. පද
V. නාම පද

**2.**

| ප්‍රාණවාචී | අප්‍රාණවාචී |
|---|---|
| ළමයා | නැව |
| සේවකයා | නිවස |
| මුවෝ | පත්තරය |
| මොනරා | කුඹුර |
| නංගී | ගහ |

**3.**

| නාම පද | ඒක වචන | බහු වචන |
|---|---|---|
| හාවෝ | | ✓ |
| පැල්පත් | | ✓ |
| කටුගෙය | ✓ | |
| ගැමියෝ | | ✓ |
| නගරය | ✓ | |
| ගම්මානය | ✓ | |
| ගෙවල් | | ✓ |
| පැන | ✓ | |
| කුඹුරු | | ✓ |
| පිට්ටනිය | ✓ | |

අන්තගර්තය : ඩබ්.ජී.ඒ.සී.දිල්හානි මිය, වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව
සැකසුම : එස්.ඒ.ආර්.එල්.සමරතුංග, ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක.බලංගොඩ

**4.**

| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|
| මම | නුඹ | කුමරිය |
| අපි | ඔබ | ළමයා |
|  | යුෂ්මතා | ධීවරයෝ |
|  | තොපි | අම්මා |

**5.**

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග |
|---|---|
| මොනරා | මිතුරිය |
| තාත්තා | ගුරුතුමිය |
| කුරුල්ලා | සෙබඩ |
| ගුරුතුමා | අම්මා |
| මිතුරා | කිරිල්ලී |

**6.**

**I.** ✗
**II.** ✓
**III.** ✗
**IV.** ✓

**අන්තගර්තය : ඩබ්.ජී.ඒ.සී.දිල්හානි මිය, වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව**
**සැකසුම : එස්.ඒ.ආර්.එල්.සමරතුංග, ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක.බලංගොඩ**

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ